# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,887 - 2014 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2014.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 974 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 978 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*-2015 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


973 – B 080887—300 (2014/10)
A 1-

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/41/2014/පිටු/සැ

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවේ සඳහන් ඔප්පුවලට අදාල පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.10.31 වැනි දින සිට 2014.11.14 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.11.21 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 2739 වෙළුමේ 244 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, පමුණුව පිහිටි "මදටියගහවත්ත" නමැති ඉඩමට අදාළව 1985.06.03 වැනි දින මැන සාදන ලද අංක 226 දරන පිඹුරේ ලොට් බී4ඒ සඳහා මායිම්,<br>උතුර : ඩී. ඒ. යහම්පත්ට අයිති ඉඩම හා හැරියට් යහම්පත්ට අයිති ඉඩම<br>නැගෙනහිර : එස්. එම්. එස්. ද සිල්වාට අයිති ඉඩම (ලොට් බී5)<br>දකුණ : පමුණුව පාරේ සිට ගෙවල් බලා යන පාර.<br>බස්නාහිර : ලොට් බී 4 බී<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 17.87 | 01. ජේ. ආර්. ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2004.02.27 දින අංක 2450 දරන උකස්කරය අවලංගු කිරීම<br>02. ඩබ්ලිව්. එල්. ජයවීර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2001.11.08 දින අංක 364 දරන උකස්කරය අවලංගු කිරීම.<br>03. එස්. එන්. එන්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2005.09.07 දින අංක 2647 දරන අවලංගු කිරීම. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

10-1002

---

**1941 අංක 39 දරන ණය සහන දායක ආඥාපනත අංක. 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක. 41 දරන පනත 1978 අංක. 29 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥා පනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. එස්. එන්. කේ. විජේතුංග,
ලේකම් (වැ.බ.),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12,
2014 ඔක්තෝබර්

| | *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|---|
| 01 | 43201 | මොහොමඩ් කාසිම් මොහොමඩ් සරුක් මයා,<br>අංක 01 සී,<br>ලේක් රෝඩ්,<br>වෙලම්බොඩ. | අබ්දුල් කාසිත් මොහොමදු හුසේන් මයා<br>අංක 164,<br>කුරදෙණිය,<br>වෙළම්බොඩ. |
| 02 | 43110 | එදිරිවීර ජයසූරිය පටබැදිගේ අනුලාවතී මිය<br>අංක 55/3ඩී,<br>කොහිලවත්ත,<br>අංගොඩ. | මුතුතන්ත්‍රිගේ රොෂාන් චම්පික කුරේ මයා,<br>අංක 263/2,<br>කෝන්ගහවත්ත,<br>උස්වත්ත,<br>වැල්ලම්පිටිය. |
| 03 | 43176 | බේරුවලගේ මානෙල් මිය,<br>අංක 354/3,<br>කෙරම්ණිය පාර,<br>අම්බලන්ගොඩ | අම්බලන්ගොඩ ගුරුන්නාසේලාගේ හිල්ඩා සේපාලි පෙරේරා මිය,<br>අංක 12,<br>කුරුදුවත්ත,<br>වතුගෙදර |
| 04. | 43189 | ගොඩැල්ල පතිරණගේ වසන්තා පද්මිණි පීරිස් මිය<br>අංක 108/ඒ,<br>හොරකැටිය පාර,<br>කොරතොට<br>කඩුවෙල. | වීචත් ආරච්චිගේ උදය ශාන්ත මයා,<br>අංක 108/2,<br>හොරකැටිය පාර,<br>කොරතොට,<br>කඩුවෙල |
| 05 | 43272 | මන්ඩාඩිගේ අමරදාස ප්‍රනාන්දු මයා,<br>අංක 205/8සී,<br>ඉසුරුමාවත,<br>දූලම්මහර,<br>පිළියන්දල | මන්ඩාඩිගේ නදීකා ඉරෝෂනි ප්‍රනාන්දු මිය,<br>අංක 110,<br>ගල්කණුව පාර,<br>ගොරකාන, කෙසෙල්වත්ත,<br>පානදුර |
| 06 | 43225 | මධුරසිංහ ආරච්චිලාගේ අයිරාංගනි මිය<br>නවසිගහවත්ත,<br>වැලිපැන්නගහමුල, | වර්ණකුලසූරිය ලලිතා පද්මිණි ප්‍රනාන්දු මිය<br>බටහිර කටුකෙන්ද,<br>දංකොටුව |
| 07 | 43249 | i. පිංචාදේවගේ සුරේෂ් ප්‍රේමරත්න මයා,<br>අංක 224,<br>පොල්හේන පාර,<br>වල්ගම, මල්වාන<br><br>ii. පිංචාදේවගේ සෝමලතා විජේරත්න මිය<br>අංක 223/බී,<br>වල්පොල,<br>රාගම | ලියනගේ තිස්ස මාදසේකර මයා,<br>අංක 822/ඒ1,<br>ධම්මසිද්දි මාවත,<br>නාරංගොඩපාලුව,<br>රාගම |

| | ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|---|
| | | (iii) පිංචාදේවගේ ප්‍රේමරත්න මයා,<br>අංක 223/බී,<br>වල්පොල,<br>රාගම | |
| 08 | 42943 | හේරත් මුදියන්සේලාගේ බණ්ඩාරමැණිකා මිය,<br>හේරත් නිවස,<br>හඳුගල,<br>පොතුහැර | වීරසේකර මුදියන්සේලාගේ උක්කුබණ්ඩා වීරසේකර මයා,<br>සුජානි, හතලිස් පහුව,<br>පොල්ගහවෙල. |
| 09 | 43227 | දොඹගහපතිරගේ මාලනී පෙරේරා මිය,<br>අංක 53/22බී,<br>සෙනරත් නිවස,<br>යෝධ මාවත, සිද්ධමුල්ල. | සීමාසහිත ජගත් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික සමාගම),<br>අංක 486,<br>ඕවිටිගල, මතුගම. |
| 10. | 43228 | (i) මොරවක කෝරලාගේ මේරියන් සුවේන්ද්‍රානි ෆොන්සේකා මිය,<br>අංක 225/2,<br>මීගමු පාර,<br>වත්තල.<br><br>(ii) මොරවක් කෝරලාගේ ඩොමිනික් සුදත් ෆොන්සේකා මයා,<br>අංක 225/2,<br>මීගමු පාර,<br>වත්තල. | තේවරාතන්ත්‍රිගේ ඈන් ගයනා විමාලි ප්‍රනාන්දු මිය,<br>අංක 40,<br>රජමල්වත්ත පාර,<br>කොළඹ 15. |
| 11 | 43024 | මලවිගේ රත්නසිරි මයා,<br>අයි/171/3,<br>දික්හේන,<br>මොරාවත්ත,<br>රුවන්වැල්ල. | විතානගේ නිශාන්ත ප්‍රගීත් සෝමචන්ද්‍ර මයා,<br>ඉහල මොරාවත්ත,<br>රුවන්වැල්ල. |
| 12 | 43315 | තෙල්ගේ මහී චමින්ද පීරිස් මයා,<br>අංක 142 සී,<br>වල්ලපල,<br>පානදුර, | වරුෂහැන්නදිගේ හිමාල් ප්‍රදීප් සොයිසා මයා,<br>අංක 134/1ඒ,<br>ශ්‍රී මේධානන්ද පාර,<br>තුඩුව, පානදුර. |
| 13 | 43143 | මිහිකුල අධිපතිගේ වසන්ත,<br>හේමානන්ද සිරිසේන මයා,<br>අංක 265/11/2ඒ,<br>කිරිකිත්තමුල්ල,<br>යක්කල. | දොඩංගොල්ලගේ ආනන්ද කුලතුංග මයා,<br>අංක 268/14/1ඒ,<br>කිරිකිත්තමුල්ල,<br>යක්කල. |
| 14 | 42774 | කොඩිමරක්කලගේ ජෝර්ජ් ප්‍රනාන්දු මයා<br>(මියගොස්)<br><br>උරුමකරුවන් :-<br>(i)කන්ඩම් කොලොත්තිගේ සුනීතා මිය,<br>අංක 14,<br>සමරනායකපුර,<br>රේරුකාන,<br>බණ්ඩාරගම. | ගලබොඩගේ නිලන්ත උදය සිල්වා මයා,<br>72බී, ජයසිරි මාවත,<br>රෝහල පාර,<br>දෙහිවල |

| | *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|---|
| | | (ii) කොඩිමරක්කලගේ තරංග ප්‍රසාද් ප්‍රනාන්දු මයා<br>අංක 14,<br>සමරනායක පුර,<br>රේරුකාන,<br>බණ්ඩාරගම<br>(iii) කොඩිමරක්කලගේ චමරි නිසංසලා ප්‍රනාන්දු මිය,<br>අංක 14,<br>සමරනායක පුර<br>රේරුකාන,<br>බණ්ඩාරගම<br>(iv) කොඩිමරක්කගේ චතුරි ප්‍රසාදිකා ප්‍රනාන්දු මිය,<br>අංක 14,<br>සමරනායක පුර,<br>රේරුකාන,<br>බණ්ඩාරගම. | |
| 15 | 43244 | (i) දෝන මාලනී කොතලාවල මිය,<br>අංක 261, පහල බෝමිරිය,<br>කඩුවෙල.<br>(ii) ලලිත් සුරංග කළුආරච්චි මයා,<br>261,<br>පහල බෝමිරිය,<br>කඩුවෙල.<br>(iii) ජනක එරංග කළුආරච්චි මයා,<br>අංක 261/1,<br>පහල බෝමිරිය,<br>කඩුවෙල | සැන්ඩ්‍රා රොසෙන් පෙරෙයිරා මිය,<br>අංක 283/7,<br>පහල බෝමිරිය<br>කඩුවෙල |
| 16 | 42976 | බ්‍රාහ්මනගේ ඉන්ද්‍රා කාන්ති පෙරේරා මිය.<br>සදලංකා උයන,<br>වලව්වත්ත, මාකඳුර,<br>ගෝනවිල. | දෝන මනුවෙල්ගේ පැට්‍රික් මයා,<br>මාවතගම,<br>දංකොටුව. |
| 17 | 43177 | (i) හෙට්ටි මුදියන්සේලාගේ ලීලාවතී මිය.<br>අංක 10/5ඒ,<br>සිම්පෝනියා වත්ත,<br>කඩවත<br>(ii) කාරියවසම් රණවීර කංකානමලාගේ<br>දුමේන්ද්‍රා සමන්මලී මිය,<br>අංක 10/5,<br>සිම්පෝනියා වත්ත,<br>කඩවත<br>(iii) කාරියවසම් රණවීර කංකානමලාගේ දුශාන්ති<br>සමන්ලතා මිය,<br>අංක 10/5ඒ<br>සිම්පෝනියා වත්ත,<br>කඩවත | වටුතන්ත්‍රිගේ ප්‍රියන්ත රන්ජන් ජූඩ් ප්‍රනාන්දු මයා,<br>අංක 10/4,<br>පරන්දෙණිය,<br>ඉඹුල්ගොඩ. |
| 18 | 43341 | කුරුවිටගේ විජේරත්න මයා<br>අංක 160/1,<br>පල්ලෙගම,<br>පැපිලියවල. | කලුආච්චිගේ දිල්රුක් මයා,<br>බෝමලුව පාර,<br>පල්ලෙගම,<br>පැපිලියවල. |

| | ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|---|
| 19 | 43245 | මුතුරත්නම් නිර්මලා මිය, තනලෙච්චමි වත්ත, බටුවිට, රුවන්වැල්ල. | අත්තනායක ලියනගේ දයාරත්න මයා, ලක්තරු මාවත, අංක 556/2, තලංගම - උතුර, බත්තරමුල්ල. |

10-974

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වාරියපොළ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් 2008 ජූලි 24 දින සහතික කළ අංක 1990 සහ 2010 අප්‍රේල් 20 දින සහතික කළ අංක 2380 සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ගාල්ලගේ විසින් 2012 මාර්තු 29 දින සහතික කළ අංක 1589 දරන බැඳුම්කරයන් මගින් කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහතකී වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු යන අය කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂක වශයෙන් එම සමාගමේ පාලනය හා කළමනාකරණය දරන බැවින් ඒ අනුව එකී වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු යන අය එකී කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකම් වල නියම අර්ථලාභියා වනුයේ එකී වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු යන අය වන හෙයින් ද,

කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු යන අයවලුන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද 2014 ජූලි 31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් පනස්නවලක්ෂ හතලිස්පන්දහස් හතලිස්හයයි ශත හැත්තෑපහක් (රු.59,45,046.75) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 59,45,046.75 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 අගෝස්තු 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර වාර්ෂික පොළියද සමඟ ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා 1990, 2380, 1589 දරන උකස් බැඳුම්කරයන් යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ වල්ගම්පත්තු කෝරළේ වාරියපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුපොත ග්‍රාමයේ පිහිටි "පල්ලියවත්ත කැබැල්ල" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගොරොක්ගහගොඩ විසින් පිළියෙල කරන ලද 1990 ඔක්තෝබර් 25 වන දින අංක 298 ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: ඉදිරියෙන් ඇති කටුපොත සිට මහකෙලිය පාරෙන් ද, නැගෙනහිරට: රෙජිස්ට්‍රාර් දිසානායකගේ ඉඩම සහ පන්සල් ඉඩමෙන් ද, දකුණට : පන්සල් ඉඩමෙන් ද සහ බස්නාහිරට : පල්ලිය ඉඩමෙන් ද මායිම් වූ අක්කර එකයි පර්චස් දහසය (අ. 01, රූ. 0, පර්. 16) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-1003

---

## මහජන බැංකුව - මොරටුමුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 නොවැම්බර් 29 වන දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 2914 හා 2007.05.30 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම සම්පත වඩුගේ මෙරිල් ජෝසප් ප්‍රනාන්දු මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2914 දරන බැඳුම්කරය මත රුපියල් තුන්ලක්ෂ හැට

දහසක (රු.3,60,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් තුන් ලක්ෂ හැට දහසක (රු.3,60,000) එකී මුදල ද 2009.04.22 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් තුන්ලක්ෂ හැට දහසක (රු.3,60,000) මුදලක් මත වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් තවදුරටත් වූ පොළියද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනෙත් 29 ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 2914 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ විල්ලෝරාවත්තේ පිහිටියා වූ ද, "හෙදවකගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. ඒ ද සිල්වා විසින් සාදන ලද අංක 2174 හා 2006.09.02 දින දරන පිඹුරේ ලොට් $2^A$ ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : එච්. ඩග්ලස් ඇන්ටනි ප්‍රනාන්දුගේ (කලින් ඩබ්. එල්. එම්. ප්‍රනාන්දු සහ ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දුගේ) දේපළ ද, නැගෙනහිරට : අංක 783 දරන පිඹුරේ දැක්වෙන එම ඉඩමේ ලොට් $2^B$ ද, දකුණට : බෝධිරාජ මාවත ද, බස්නාහිරට : අංක 783 පිඹුරේ දැක්වෙන (අඩි 8 පළල පාර වන) එම ඉඩමේ ලොට් අංක 1 ද, මායිම් වන්නා වූ ද පර්චස් හයක් (අක්. 0, රූඩ්. 0, පර්. 6.0) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මැනීමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ මෝල්පේ පිහිටියා වූ ද , හෙදවකගහවත්ත, යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එස්. මෙන්ඩිස් විසින් සාදන ලද අංක 783 හා 1977.01.19 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ඒ ලෙස ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ඩබ්. එල්. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 2 B දරන කොටස ද, දකුණට : බෝධිරාජ මාවතද, බස්නාහිරට : ලොට් අංක 1 ලෙස ලකුණු කළ අඩි 8 ක් පළල පාර සඳහා වෙන් කිරීම ද, මායිම් වන්නා වූද , ඉහත කී අංක 783 දරන පිඹුරට අනුව පර්චස් හයක් (අ.0, රූ. 0, පර්. 6.0) විශාල වූ ද, කොළඹ දිස්ත්‍රික්ක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1156/228 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර, ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත්ය.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1999/217 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

10-1094

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එන්. එස්. හෝල්ඩින්ස්.
ගිණුම් අංක : 0173 1000 0167.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014 අගෝස්තු මස 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2012 අප්‍රේල් මස 20 දාතම හා අංක 3496 දරන හා 2013 අප්‍රේල් මස 09 දාතම හා අංක 3753 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "එන් එස් හෝල්ඩින්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන දෙල්ප චිත්‍ර ආරච්චිගේ නිලන්ත කුමාර යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද එකී අංක 3496 සහ 3753 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි පනස් එක් දහස් හයසිය දෙකයි ශත අනූ හයක (රු. 10,051,602.96) මුදලක් 2014 ජූලි 30 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි පනස් එක් දහස් හයසිය දෙකයි ශත අනූ හයක (රු. 10,051,602.96) මුදල ද, 2014 ජූලි 31 වැනි දින සිට අංක 3496 සහ 3753 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ තුන් ලක්ෂ අනූ අට දහස් තුන්සිය පනස් නමයයි ශත හැටක (රු. 8,398,359.60) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) හා තවත් රුපියල් දෙලක්ෂ විසි දහසක (රු. 220,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් වූ පොළියද දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3496 සහ 3753 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසි කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මුල්ලේරියාව කොටිකාවත්ත දුව 505 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොටිකාවත්තේ පිහිටි කොටිකාවත්ත පාර වරිපනම් අංක 125/7 දරන "දුවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. බී. ආරච්චිගේ යන අය විසින් සාදන ලද 2012 මාර්තු 27 දාතම හා අංක 3044 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට

ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1940 දරන පිඹුරේ ලොට් බී සහ පාර, නැගෙනහිරට : බලයලත් මානක තැන එච්. අනිල් පීරිස් යන අය විසින් සාදන ලද අංක 875 දරන පිඹුරේ ලොට් 21 සහ පාර, දකුණට : පාර සහ බස්නාහිරට : බලයලත් මානක තැන කේ. කනගරත්නම් යන අය විසින් සාදන ලද අංක 4943 දරන පිඹුරේ ලොට් 1 ඒ සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 23.3) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 3044 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 1992 ජනවාරි මස 22 දාතම හා අංක 1940 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් සී දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අංක 3044 දරන පිඹුරේ එකී ලොට් ඒ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කොටිකාවත්තේ පිහිටි "දුවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 1992 ජනවාරි මස 22 දාතම හා අංක 1940 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් ඩී වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී සහ සී, නැගෙනහිරට : බලයලත් මානක තැන එච්. අනිල් පීරිස් යන අය විසින් සාදන ලද අංක 875 දරන පිඹුරේ ලොට් 21, දකුණට : පාර, සහ බස්නාහිරට : පාර සහ බලයලත් මානක තැන කේ. කනගරත්නම් යන අය විසින් සාදන ලද අංක 4943 දරන පිඹුරේ 1 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 23.3) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1940 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එෆ් 30/12 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

10-1139/1

---

**මහජන බැංකුව - පානදුර නගර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 අගෝස්තු 29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එච්. සන්ධ්‍යා ද සිල්වා විසින් සහතික කරන ලද 2010.02.08 දිනැති අංක 3324 දරන උකස්කරය ද කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. කේ. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2010.09.03 දිනැති අංක 3709 දරන උකස්කරය සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී සිරෝමි විසින් සහතික කරන ලද 2013.01.04 දිනැති අංක 456 දරන උකස්කරය මත, අනුර හේමා වික්‍රමතිලක ගුණසේකර/යොන්මෙරොඤ්ඤ සිමන් හේවාගේ මංගලිකා ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී අංක 3324 දරන උකස්කරය යටතේ දැනට රුපියල් මිලියන පහකුත් දෙසීය අසූපන් දහසක (රු.5,285,000) මුදලක් ද එකී අංක 3709 දරන උකස්කරය යටතේ දැනට රුපියල් මිලියන දහඅටකුත් අටසිය හැට දහසක (රු.18,860,000) ක සහ එකී අංක 456 දරන උකස්කරය යටතේ දැනට මිලියන නවයකුත් නවසිය දොළොස් දහස් දෙසීය අසූවක (රු.9,912,280) මුදලක් ද මහජන බැංකුවට අය විමට ඇති බැවින්ද 2010.01.28 දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් මිලියන පහකුත් දෙසීය අසූපන් දහසක (රු.5,285,000) මුදල සඳහාද 2010.09.03 දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් මිලියන දහඅටකුත් අටසිය හැට දහසක (රු.18,860,000)මුදල සඳහා ද 2013.01.04 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් මිලියන නවයකුත් නවසිය දොළොස් දහස් දෙසීය අසූවක (රු.9,912,280) මුදල සඳහා ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් සඳහා අයකර ගැනීමට කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 3324, 3709 සහ 456 යන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කරන ලද දේපළ විස්තර**

*උපලේඛනය*

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ් 607/215 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර යන ගම පිහිටා ඇති ගුළුගහවත්ත මුත්තෙට්ටුවගේ කුඹුර නොහොත් වත්ත, විල්ලෙබද්දෙයිරාවල්ල සහ මැද කුඹුර මුත්තෙට්ටුව හෙවත් ඕවිට නමැති ඉඩමේ කැබලි අංක 1ට අවසරලත් මානක ඩබ්. අබේසුන්දර විසින් වර්ෂ 2014.08.31 වැනි දින මැන සකස් කරන ලද අංක 753ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන ඉඩමට මායිම් උතුරටː මීටර් 0.45 පළල අගල සහ අඩි 20 ක පාරක් සඳහා වෙන්කල කැබලි අංක 26 ද, නැගෙනහිරට : කැබලි අංක 2 සහ මීටර් 0.45 පළල අගල ද, දකුණට : අංක 3041 දරන පිඹුරේ කැබලි අංක 2 ද සහ බස්නාහිරට : ගාළු පාර සහ මීටර් 0.45 පළල අගල ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම හතයි පහ (අ. 0, රූ. 0, ප 21.75) විශාල ඉඩම සහ එය තුළ පිහිටි ගහකොළ, පළතුරු ඇතුළු සියලු දෙය වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු (කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාළු පාර,
පානදුර.

10-1097

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක, 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එච්. ජී. පී. පියතිලක සහ ආර්. එල්. ජයනෙත්ති.
ගිණුම් අංක : 0034 5000 7357.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ මාර්තු මස 21 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් මස 06 දාතම හා අංක 792 දරන සහ ජී. එන්. එම්. කොඩාගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2008 නොවැම්බර් 04 දාතම හා අංක 949 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රසිකා ලලන්ති ජයනෙත්ති සහ හැගොඩ ගමගේ බන්දුල පියතිලක යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී රසිකා ලලන්ති ජයනෙත්ති යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 792 සහ 949 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ ලක්ෂ හැට දහස් හත්සීය අනූ නමයයි ශත අසූ හතක (රු. 7,060,799.87) මුදලක් 2014 පෙබරවාරි මස 19 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ ලක්ෂ හැට දහස් හත්සිය අනූ නමයයි ශත අසූ හතක (රු. 7,060,799.87) මුදල ද, 2014 පෙබරවාරි මස 20 දින සිට අංක 792 සහ 949 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන් ලක්ෂ හය දහස් දෙසීය හැත්තෑ දෙකයි ශත විසි තුනක (රු. 13,06,272.23) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) රුපියල් තිස් ලක්ෂ විසි දෙදහස් තුන්සිය දහ නමයයි ශත හැත්තෑ දෙක (රු. 30,22,319.75) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් විසි එක් ලක්ෂ අසූ අට දහස් දෙසීය අනූ පහයි ශත දහයක (රු. 2,188,285.10) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 792 සහ 949 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ කිරුල පාර වෝඩ් අංක 41 තිඹිරිගස්යාය පිහිටි ෆයිප් පාර වරිපනම් අංක 8A දරන "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානන තැන එස්. රාසප්පන් යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් 05 දාතම හා අංක 521/2006 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට, උතුරට : තිඹිරිගස්යාය පාර වරිපනම් අංක 6 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : ෆයිෆ් පාර, දකුණට : ලොට් C සහ බස්නාහිරට : ලොට් B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 07) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 521/2006 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 1098/81 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එස් රාසප්පා යන අය විසින් සාදන ලද 2006 අප්‍රේල් 28 දාතම හා අංක 207/2006 දරන පිඹුරේ දක්වා ඇති (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) මතින් හා ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

10 - 1139/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. එම්. ඩී. පී. පෙරේරා.
ගිණුම් අංක : 1035 5419 0834.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014 සැප්තැම්බර් 25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. එන් ද සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2013 ජූලි 05 දාතම හා අංක 1105 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැණික්ගම මුදියන්සේලාගේ ධම්මික ප්‍රභාත් පෙරේරා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක 1105 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැට හතර ලක්ෂ පනස් දෙදහස් හයසිය පහයි ශත අසූ හයක (රු.6,452,605.86) මුදලක් 2014 සැප්තැම්බර් 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැට හතර ලක්ෂ පනස් දෙදහස් හයසිය පහයි ශත අසූ හයක (රු.6,452,605.86) මුදලද, 2014 සැප්තැම්බර් 03 දින සිට අංක. 1105 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හත් ලක්ෂ අනූ එක් දහස් නමසිය අසූ අටයි ශත පනස් හතක (රු.5,791,988.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1105 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට

ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ - පොද්දල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බෝපේ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමාවන් තුළ කහදූවවත්ත 124C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිතුලම්පිටිය පිහිටි "ගෙදරවත්ත නොහොත් තන්තිලගේවත්ත නොහොත් දෙණියේවත්ත හි යාබද හා ඒකාබද්ධ ලොට් C6[1] හි ලොට් A සහ B යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ජී. උපසේන යන අය විසින් සාදන ලද 2013 මාර්තු 15 දාතම හා අංක 1176 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 6 සහ පාර නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 2 දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට පාර (අංක 560 දරන පිඹුරේ ලොට් C9) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයයි පහක් (අක්. 0, රූ. 0, පර්. 20.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග වෙළුම/පත්‍රිරුව R29/05 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

